**මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතිය - 2013**

මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර 2008 සැප්තැම්බර් 03 දින එළඹි අංක එස්එල්-පී 90 දරන අතුරු ණය ගිවිසුමේ IV වාවස්ථාවේ 4.03 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. වර්තමානයේ ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය ලෙස හඳුන්වනු ලබන ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපන් බැංකුව සහ ශ්‍රී ලංකා රජය අතර 2007 මාර්තු 28 දින එළඹි අංක එස්එල්-පී 90 දරන ණය ගිවිසුම අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මාලිගාකන්දේ නව කාර්යාල ගොඩනැඟිලි සංකීර්ණයක් හා නව ජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම, එලි හවුස් හි ජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම, මුල්ලේරියාව හා කොට්කාවත්ත ප්‍රදේශවල ජල සැපයුම පුළුල් කිරීම සහ කොළඹ නාගරිකයේ තෝරාගත් වතු නිවාස සඳහා ජල සම්බන්ධතා ලබා දීම මඟින් කොළඹ නාගරිකය සහ කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රදේශ වල ජල සම්පාදනය ප්‍රතිසංස්කරණය හා වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 4,785 කට සමාන ජපන් යෙන් මිලියන 5,359 ක් වූ අතර ඉන් රු. මිලියන 3,549 කට සමාන ජපන් යෙන් මිලියන 3,975 ක් හෝ සියයට 74.18 ක් ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය විසින් ලබා දීමට එකඟ වී ඇති අතර ඉතිරි ශේෂය වන රු. මිලියන 1,236 කට සමාන ජපන් යෙන් මිලියන 1,384 ක් හෝ සියයට 25.82 ක් ශ්‍රී ලංකා රජය විසින් ලබාදීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2007 නොවැම්බර් 27 දින ආරම්භ කළ අතර 2012 ජනවාරි වන විට අවසන් කිරීමට නියමිත විය. පසුව, ව්‍යාපෘති කාලය 2015 සැප්තැම්බර් දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි.ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල

උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරික්ෂා කිරීම්ද පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි ද බව,

(ඉ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

--------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මතය**

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2007 අගෝස්තු 07 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 අනුව, 2014 මාර්තු 31 හෝ එදිනට පෙර විගණකාධිපති වෙත එවීමට නියමිත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන එවා තිබුණේ 2015 ජූලි 04 දිනදීය.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අතුරු ණය මත මහා භාණ්ඩාගාරය විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් 2013 දෙසැම්බර් 31 දිනට අය කළ රු. මිලියන 172.64 ක පොළී මුදල කෙරීගෙන යන සිවිල් වැඩ යටතේ දක්වා තිබුණි.

(ආ) ගෙවන ලද එකතුව රු. මිලියන 370.47 ක එකතු කළ අගය මත බදු, කෙරීගෙන යන වැඩ යටතේ දක්වනවා වෙනුවට රජයේ දායකත්ව අරමුදලට එරෙහිව හිලව් කර තිබුණි.

### 2.2.3 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මුදල් රෙගුලාසි අංක 756 ප්‍රකාරව ව්‍යාපෘති දේපල, යන්ත්‍ර හා පිරියත වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයන් සිදු කර නොතිබුණි. තවද, 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක අයිඒඅයි/2002/02 අනුව, පවත්වා ගත යුතු ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට වසර 05 ක සේවා කාලය ඉක්මවා ඇති ව්‍යාපෘති සේවකයින් 02 කු සඳහා පාරිතෝෂිත ප්‍රතිපාදනය මූල්‍ය ප්‍රකාශන වල සිදුකර නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

-----------------------------------------

**3.1 අරමුදල් උපයෝජනය**

-------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2013 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණය ගිවිසුමේ මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල** | | **සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කළ වෙන්කිරීම** | | **අරමුදල් උපයෝජනය** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | **2013 වර්ෂය තුළ** | | **2013 දෙසැම්බර් 31 දිනට** | |
| | **ජ.යෙන් (මිලියන)** | **රු. (මිලියන)** | **ජ.යෙන් (මිලියන)** | **රු. (මිලියන)** | **ජ.යෙන් (මිලියන)** | **රු. (මිලියන)** | **ජ.යෙන් (මිලියන)** | **රු. (මිලියන)** |
| ජා.ස.ජ.නි. | 3,975 | 3,549 | 381.68 | 500 | 372.24 | 488.22 | 2,325.98 | 3,168.52 |
| ශ්‍රී.ලං.ර | 1,384 | 1,236 | 106.87 | 140 | 77.86 | 102.00 | 659.24 | 896.57 |
| **එකතුව** | **5,359** | **4,785** | **488.55** | **640** | **450.10** | **590.22** | **2,985.22** | **4,065.09** |

**3.2 භෞතික ප්‍රගතිය**

---------------------

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කළ ප්‍රගති වාර්තා අනුව, මාලිගාකන්ද කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම, ගොතටුව- මුල්ලේරියාව- කොටිකාවත්ත ප්‍රදේශවල ජලය බෙදා හැරීමේ ජාලය සැපයීම හා නල එළීම සහ එළි හවුස් ජලාශය ප්‍රතිසංස්කරණය කිරීමේ භෞතික ප්‍රගතිය 2013 දෙසැම්බර් 31 දිනට සියයට 90 ක් වාර්තා වී තිබුණු අතර නිම කළ වැඩ 2014 දී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත බාර දී තිබුණි. ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කළ අනෙකුත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට සුදුසු ඉඩම් ලබා දීමට කොළඹ නගර සභාවේ ප්‍රමාදය හේතුවෙන් මාර්ග ප්‍රතිසංස්කරණ සඳහා වැඩ, වාහන නවතා තැබීමේ ප්‍රදේශයේ සංවර්ධන කටයුතු, බිම් සැකසීමේ කටයුතු සහ සම්බන්ධිත තාප්ප පිළිසකර කිරීම හා අංගනයේ වැට සකස් කිරීම ආදීය සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) කොළඹ නගර සභාව සතු ඉඩමේ අයිතිය ලබා ගැනීම අවසන් කර තිබුණද මාලිගාකන්ද පෙරහන්ගාරයේ ඉදිකිරීම් වැඩ විගණන ක්ෂේත්‍ර පරීක්ෂණ දින වන විටත් ආරම්භ කර නොතිබුණු බව 2015 අගෝස්තු 14 දින සිදුකළ භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස 2014 වර්ෂය අවසාන වන විට රු. 275,091,484 ක පිරිවැයකට නිම කළ මාලිගාකන්ද ජලාශය නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) භෞතික ඉලක්ක ආවරණය වන විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම ව්‍යාපෘතිය විසින් සකස් කර තිබුණද, වැඩවල බැහැරවීම් හඳුනාගෙන නිවැරදි කිරීමට ප්‍රමාණවත් යාන්ත්‍රණයක් හඳුන්වා දී නොතිබුණි. එම නිසා ව්‍යාපෘති ක්‍රියාකාරකම් පාලනය කිරීම සඳහා ඵලදායී කාරකයක් ලෙස ක්‍රියාකාරී සැලැස්ම භාවිතා කර නොතිබු බවට එය සාක්ෂියක් විය.

### 3.3 මතභේදයට තුඩු දෙන කරුණු

--------------------------------

පරිචයක් ලෙස, ව්‍යාපෘති සේවක පාරිශ්‍රමිකය ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදුකරන අතර ව්‍යාපෘතිය එහි පරිපාලන වැඩ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන ගියද, සියයට 20 ක් පොදුකාර්යය වියදම් ලෙස මණ්ඩලය ව්‍යාපෘතියෙන් අය කරයි. 2013 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 73.37 ක් වූ පොදුකාර්යය වියදම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අයකරගෙන තිබුණි.

### 3.4 මූල්‍ය පාලනයේ අඩුපාඩු

----------------------------

මුදල් රෙගුලාසි 134 (3) හා 2010 ජූලි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 05 ප්‍රකාරව ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණනය කර නොතිබුණි.